ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා සමඟ දුරකථන සාකච්ඡාවක නිරත වේ**

ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා අද දින දිනේෂ් ගුණවර්ධන මැතිතුමා නැවතත් ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යවරයා වශයෙන් පත්වීම පිළිබඳව සුබ පැතීම සඳහා දුරකථන ඇමතුමක් ලබා දුන්නේය. ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා ඉහළ තලයකට ගෙන ඒම සඳහා දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා සමඟ සමීපව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ආචාර්ය ජයිශංකර් මැතිතුමා ප්‍රකාශ කළේය.

අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඊයේ දින වැඩ බාර ගැනීමෙන් අනතුරුව ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා අමාත්‍යවරයා හමු විය. එහිදී, මහ කොමසාරිස්තුමා ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමාගේ සුබපැතුම් පණිවිඩයක් භාර දුන් අතර ශ්‍රී ලංකා රජය මහ මැතිවරණයෙන් ලද ශක්තිමත් ජනවරම ද්විපාර්ශවික සබඳතාවය ඉදිරියට ගෙනයාම සඳහා දෙරට විසින්ම දක්වන කැපවීම ශක්තිමත් කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි සඳහන් කළේය.

මෙම හමුවේදී, අමාත්‍ය ගුණවර්ධන මැතිතුමා පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ සමීප සහයෝගීතාවයක් පවත්වාගෙන යාම ඉන්දියාවට සහ ශ්‍රී ලංකාවට වැදගත් වන බව පෙන්වා දුන්නේය. සීමිත ලෙස දෙරට අතර ගමනාගමනය සහ සංචාරක කටයුතු පුළුල් කිරීමට අපේක්ෂා කරන බවද එතුමා පැවසීය.

බෞද්ධ සබඳතා පුළුල් කිරීම සඳහා සමීප සහයෝගීතාවයක් ගොඩනඟා ගැනීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණ. බෞද්ධ වන්දනාකරුවන්ගේ සංචාරක පහසුව සඳහා කුෂිනගර් ගුවන්තොටුපළ ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස සංවර්ධනය කිරීමට ඉන්දියානු රජය ගත් තීරණය පිළිබඳව අමාත්‍යතුමා සිය සතුට පළ කළේය. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා සහ අමාත්‍ය ගුණවර්ධන මැතිතුමා ද්විපාර්ශවික වශයෙන් වැදගත් කලාපීය සහ ජාත්‍යන්තර කරුණු පිළිබඳවද සාකච්ඡා කළෝය.

ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ආරාධනයක් මත  අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පසුගිය අමාත්‍ය ධුර කාලය තුළ පළමු නිල විදේශ සංචාරය වශයෙන් 2020 ජනවාරි මසදී ඉන්දීය සංචාරයක නිරත විය.

***

කොළඹ
2020-08-18